# ලිපි අංක 127 තීරණ අංක 130/2009

**මහජන පුස්තකාලයේ භාවිතයේ පවතින නීති සංශෝධනය කර ගැනීම**

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් මහතාගේ ඉහත කරුණට අදාළ ලිපිය සභා ගත කරන ලදී.

එහි සඳහන් වුයේ පුස්තකාලයෙන් බැහැරට ගෙන යන පොතක් දින 14 ක් ඇතුලත දී ආපසු භාර දිය යුතුය. නැතහොත් එතැන් සිට දිනකට එක පොතක් සඳහා රුපියලක දඩ මුදලක් ගෙවීමට සිදුවේ.

බැහැර ගෙන යන ලද පොතක් සාමාජිකයා අතින් නැති වුව හොත් පොතෙහි වටිනාකම රු.100/- වඩා අඩු නම් රු.300/- ක මුදලක් හා අදාළ ප්‍රමාද දඩ මුදලත් 25 ක දෙපාර්තමේන්තු ගාස්තු අය කිරීම.

පොතෙහි වටිනාකම රු.100/- ට වඩා අඩු වැඩි වුව හොත් අදාළ පොතෙහි වටිනාකම මෙන් දෙගුණයක් හා අදාල ප්‍රමාද දඩ මුදලත් 25 දෙපාර්තමේන්තු ගාස්තුත් අය කිරීම .

මහජන පුස්තකාලයේ බැහැර දෙන අංශයේ සතියේ සඳුදා සිට සෙනසුරාදා දක්වා දිනපතා පෙ.ව.8.30 - 4.45 දක්වා විවෘතව පවතී. ඉරිදා දින සහ රජයේ නිවාඩු දිනවල මෙම පුස්තකාලය වසා ඇති බවද අවසන් වශයෙන් සඳහන් කර තිබුණි.

මෙම ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධව මන්ත්‍රීතුමන්ලා විමසීම් කරන ලදී. එහිදී සභාපති තුමන් පවසන් ලද්දේ පුස්තකාලයේ සාමාජිකත්වය ලැබීම් සඳහා වරිපනම් බදු ගෙවන අය හෝ මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙකු හෝ ග්‍රාම නිලධාරී මහතා ඇප විය යුතු බවයි . පුස්තකාල පොත් බැහැර දීමේදී දැනට දිනකට ශත පනහක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙසට අය කරන බවයි.

ඉන් අනතුරුව ප්‍රමාද ගාස්තුව දිනකට රුපියලක් ලෙසට අය කිරීමත් ඉහත පොත් නැතිවීමේදී ගාස්තු අයකිරීමත් සුදුසු බවට ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ජී.එච්.සෝමරතන මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ඒ. එම්. හනීෆා මහතා එය ස්ථිර කරන ලදී. එය සභා සම්මත විය.